වගා සහනාධාර චක්‍රලේඛ අංක 44

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,
ස්ථානභාර නිලධාරී
කෑගල්ල/කළුතර

මගේ අංකය : සං/ව.ආ/ප්‍රති VI
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474, කොළඹ.
1994.12.30 දින.

## තේ වගා සහනාධාර ක්‍රියාත්මක කිරීම පිළිබඳව
## 1995 වර්ෂයේ සිට අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත

තේ නැවත වගාව සහ තේ අලුත් වගාව යටතේ 1995 ජනවාරි මස 01 වැනි දින සිට මෙහි පහත දැක්වෙන ක්‍රියාමාර්ගය අනුගමනය කරන්න.

(1) සහනාධාර පරීක්ෂණ

තේ නැවත වගාව සහ අලුත් වගාව යටතේ ගෙවීම් වාරික ගණන තුන (03) ක් දක්වා අඩුකර ඇත. ඒ අනුව පහත සඳහන් පරිදි අදාල බිම් කොටස් පරීක්ෂා කිරීමත් ඊට අදාල වාර්තා සැපයීමත් සිදුකළ යුතුය.

මූලික පරීක්ෂණය -
තේ වගාවට ඇති යෝග්‍යතාවය පිරික්සීම --

දෙවන පරීක්ෂණය -
උදුරා දැමීම සහ පස සංරක්ෂණයට අදාල ප්‍රථම වාරිකය ගෙවීමේ පරීක්ෂණය.

තෙවන පරීක්ෂණය -
තෘණ සිටුවා එක් වර්ෂයකට පසුව පවත්වන ව්‍යාප්ති පරීක්ෂණය
තෘණ වගාවේ තත්ත්වය, තේ පැල තවාන/තේ පැල සපයාගන්නා ආකාරය වාර්තා විය යුතුය. තවද ඉහත කරුණු සහ තෘණ කැපීම, වලවල් ලකුණු කිරීම, වලවල් කැපීම, තේ පැල සිටුවීම වැනි කරුණු පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදිය යුතුය.

සිව්වන පරීක්ෂණය -
පස සාරවත් කිරීම පිළිබඳව තෘණ සිටුවා මාස 18 කට පසු පවත්වන දෙවන වාරික ගෙවීම් පරීක්ෂණය. මෙහිදී පැල සිටුවීම සහ රැකබලා ගැනීම පිළිබඳව උපදෙස් දීම අවශ්‍යය.

පස්වන පරීක්ෂණය -
තේ පැල සිටුවීම පිළිබඳව පවත්වන තෙවන වාරික ගෙවීම් පරීක්ෂණය. සිටවූ පැල පළමු වසරේ රැකබලා ගැනීම, පොහොර යෙදීම ගැන උපදෙස් දීම අවශ්‍යය.

සයවැනි පරීක්ෂණය -
පැල සිටුවා එක් වර්ෂයකට පසු පවත්වන ව්‍යාප්ති පරීක්ෂණය. පැලවල වර්ධනය සහ නඩත්තුව, පොහොර යෙදීම, සෙවන වැනි කරුණු වාර්තාවිය යුතු අතර, දෙවන වසරේ පැල නඩත්තු කිරීමට අවශ්‍ය සියලු උපදෙස් සැපයිය යුතුය.

(2) ගෙවීම

(අ) පහත සඳහන් පරිද්දෙන් ගෙවීම් කළයුතුය.

| ගෙවන අවස්ථාව | නැවත වගාව උඩරට/මැදරට (හෙක්/රුපි) | නැවත වගාව පහත රට (හෙක්/රුපි) | අලුත් වගාව (හෙක්/රුපි) |
|---|---|---|---|
| 1. බිම් සැකසීම<br>පැරණි වගාව උදුරා දමා පස සංරක්ෂණ ක්‍රම යෙදූ පසු | 16,000 | 12,000 | 5,000 |
| 2. පස සාරවත් කිරීම<br>මාස 18 ක් නඩත්තු කළපසු (තෘණ ඉවත් කිරීමට පෙර) | 9,000 | 6,000 | 6,000 |
| 3. තේ වගා කිරීම<br>තේ පැල සිටුවීම (පැල සිටුවා රැකබලා ගැනීමේ ක්‍රම යෙදූ පසු | 42,000 | 39,000 | 25,000 |
| | 67,000 | 57,000 | 36,000 |

(ආ) 1. 1995 ජනවාරි මස 01 වන දින සිට තේ වගා කිරීම දක්වා පවත්වන පරීක්ෂණ වෙනුවෙන් සංශෝධිත වාරික ගෙවීම් කළ යුතුය.

11. දැනට පවතින වාරික ගෙවීමේ ක්‍රමය (පැරණි ක්‍රමය) මත පවත්වා ඇති තේ වගා කිරීමේ පරීක්ෂණ අනුව ගෙවීම් නිර්දේශ කර ඇති හෝ ඒ සඳහා ගෙවීම් කර ඇති අවසර පත්‍ර වෙනුවෙන් එකී පැරණි ක්‍රමය යටතේ පළමු වසර නඩත්තු කිරීම සඳහා ගෙවිය යුතු වාරික මුදල පරීක්ෂණයකින් තොරව මසක් ඇතුලත ගෙවා නිම කළ යුතුය.

111. ඉහත අංක (1) සහ (2) අ. ඡේද මගින් දක්වා ඇති පරීක්ෂණ පැවැත්වීමේ අවස්ථා සහ ගෙවීම් වාරික සහ ඊට අදාල මුදල් පිළිබඳව අදාල අවසර පත්‍ර හිමියන්ට ලිඛිතව දැනුම් දිය යුතුය.

3. නිරිතදිග මෝසම් කලාපයට අදාල ප්‍රදේශ වල ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනය (1994.09.30 දින) දක්වා ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සඳහා 1995 වර්ෂය වෙනුවෙන්වගා අනුමැතිය දීමට කටයුතු කරන්න. තවද නැවත වගාව සඳහා පමණක් එදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍රවලට වුවද අදාල කන්නයට අනුමැතිය දීමට පුළුවන.

(අ) නැවත වගාව

තේ කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව තේ නැවත වගාව, ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සේවාවන් අතර ප්‍රමුඛස්ථානයේ ලා සැලකිය යුතුය. මේ සඳහා විශේෂත්වයක් දැක්වීම පිණිස සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් විසින් තම ව්‍යාප්ති සේවාවේ ප්‍රතිඵලයක් වශයෙන් දැනටමත් නැවත වගාවට යොමුවී නොමැති ඉඩම් කට්ටි වලින් යටත් පිරිසෙයින් ඉඩම් කට්ටි 5 ක් තෝරාගෙන විශේෂ නැවත වගා ව්‍යාපාති ආරම්භකර තම පෞද්ගලික අධීක්ෂණය යටතේ පවත්වාගෙන යා යුතුය. සුදුසු ස්ථානවල පිහිටුවනු ලබන මෙම නැවත වගා බිම් කට්ටි සිය උපදේශක සේවාව සඳහා ආදර්ශ ලෙස භාවිතා කළ හැකිය. තෝරා ගන්නා බිම් කට්ටි පිළිබඳව ඉඩම අයිතිකරුගේ නම, ලිපිනය, ඉඩමේ පිහිටීම, මුළු වගා බිම් ප්‍රමාණය, ආදර්ශ වගා සැලැස්ම සහිතව අධීක්ෂණ නිලධාරිට සහ ප්‍රාදේශීය කළමනාකරු වෙත වාර්තා කළයුතුය. තවද මේ සඳහා සහනාධාර, ණය මුදල් ලබාදීම පිණිස නොපමාව කටයුතු කළයුතුය.

(ආ) අලුත් වගාව

(1) අලුත් වගාව සඳහා ඉල්ලුම්කරන බොහෝ ඉඩම්වල පසේ තත්ත්වය තේ වගාවක් ඇති කිරීමට තරම් සාරවත් තත්ත්වයක නොමැති බව පෙනී යයි. එබැවින් 1995.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අලුත් වගාව සඳහා තේ සිටුවීමට ප්‍රථම පස සාරවත් කිරීම අනිවාර්ය ලෙස සැලකිය යුතුය.

11. දිර්ඝ කාලයක් තිස්සේ ස්වභාවිකව තැලෑ වැවුණ හෝ වෙනයම් හේතූන් නිසා පස සාරවත් කිරීම මේ අනිවාර්ය අවශ්‍යතාවයෙන් මුදවා හැරීම සුදුසු බවට ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මූලික පරීක්ෂණය අනුව වාර්තාවන ඉඩම් අධිකාරියේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති) හෝ ඊට ඉහළ ශ්‍රේණියක තාක්ෂික දැනුමක් සහිත මාණ්ඩලික නිලධාරියෙකුගේ හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ වාර්තාවක් මත එකී අනිවාර්යය අවශ්‍යතාවයෙන් මුදා හැරීමට පුළුවන.

111. එක් ඉඩමකට වර්ෂයකට අක්. 1 1/2 ක උපරිම බිම් ප්‍රමාණයක් දක්වා අලුතින් වගාව සඳහා සහනාධාර සැපයීමට පුළුවන.

සභාපති.

පිටපත් :-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති)
2. මුදල් කළමනාකරු
3. අභ්‍යන්තර විගණක
4. සහකාර සාමාන්‍යාධිකාරි - ශිල්පී (වගා සහනාධාර)
5. කළමනාකරු (ව්‍යාපාති)
6. සංඛ්‍යා ලේඛණඥ